# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/31 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/05 හා 2023.01.30 වැනි දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 වැනි දින නොපැවැත්වෙන බව ද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බව ද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උපවගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
තේරීම්භාර නිලධාරි,
මහනුවර පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39049 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

මහනුවර මහා නගර සභාව

වත්තේගම නගර සභාව

කඩුගන්නාව නගර සභාව

ගම්පොළ නගර සභාව

නාවලපිටිය නගර සභාව

තුම්පනේ ප්‍රාදේශීය සභාව

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

අකුරණ ප්‍රාදේශීය සභාව

පූජාපිටිය ප්‍රාදේශීය සභාව

පාතදුම්බර ප්‍රාදේශීය සභාව

පන්විල ප්‍රාදේශීය සභාව

උඩුදුම්බර ප්‍රාදේශීය සභාව

මිනිපෙ ප්‍රාදේශීය සභාව

මැදදුම්බර ප්‍රාදේශීය සභාව

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

පාතහේවාහැට ප්‍රාදේශීය සභාව

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව

යටිනුවර ප්‍රාදේශීය සභාව

උඩුනුවර ප්‍රාදේශීය සභාව

උඩපළාත ප්‍රාදේශීය සභාව

ගඟ ඉහල කෝරළය ප්‍රාදේශීය සභාව

පස්බාගේ කෝරළය ප්‍රාදේශීය සභාව

EOG 03 - 0089

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.